**GMOA**

ESTABLISHED IN 1926
TU No. 291

**THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION**

No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

26/07/2012

## <u>පුවත්පත් නිවේදනයයි.</u>

ශ්‍රී ලංකා රජයේ හා සෞඛ්‍ය අමාත්‍යාංශයේ මූලික පරමාර්ථය, ශ්‍රී ලංකාව ආසියාවේ සෞඛ්‍ය කේන්ද්‍රස්ථානය කිරීම බව ජන මාධ්‍ය තුලින් නිරන්තරයෙන් අවධාරනය කරයි. කරුනු මෙසේ තිබියදී සෞඛ්‍ය අමාත්‍යාංශ නිලධාරින් මෙම පරමාර්ථය සාර්ථක කර ගැනීමට දායක වන්නේදැයි අප තුල සැකයක් පවතී. මීට හේතුව ලෙස ලංකාවේ වැඩිම රෝගීන් පිරිසකගේ මරණය සිදුවන හෘදරෝග ප්‍රතිකාර කටයුතු සඳහා අමාත්‍යාංශය දක්වන අනුග්‍රහය අවම මට්ටමක පවතින බවත් එය වැඩිදියුණු කිරීම සඳහා නිද්‍රශීලී පිළිවෙතක් අනුගමනය කරන බවත් පෙනී යයි.

ලංකාව තුල සෑම වසරකම හෘදරෝග ශල්‍යකර්ම 5500ක් පමණ සිදුකරන අතර ඉන් 50%ක් පමණ රජයේ රෝහල් වලදී ද අනෙක් 50% ක් පමණ ප්‍රමාණය පෞද්ගලික රෝහල්වලදී සිදුකරනු ලබන්නේ රෝගින්හට වෙනත් විකල්ප නොමැති බැවිනි. පෞද්ගලික රෝහලකින් මෙම ශල්‍යකර්මයන් සිදුකිරීම සඳහා රු.550,000 - රු.1000000 අතර මුදලක් වැය කිරීමට සිදුවේ. එයට මූලික හේතුව වී ඇත්තේ රජයේ මෙම සැත්කම් දැනට සිදුකරනු ලබන්නේ කොළඹ ජාතික රෝහල, රිජ්වේ ආර්‍යා ළමා රෝහල, නුවර මහ රෝහල සහ කරාපිටිය රෝහල යන සීමිත රෝහල් කිහිපයක පමණක් වීම හා දිගු කාලයක් ලැයිස්තුගතව සිටීමට සිදුවීමය. ලැයිස්තුගතව තමන්ගේ වාරය තෙක් බලා සිටින අසරණ රෝගීන් ශල්‍යකර්මයට පෙර ජිවිතයෙන් සමුගෙන ඇත. තවද ඉහත රෝහල්වල පවා ශල්‍යකර්ම සිදුකිරීමට අත්‍යාවශ්‍යය මෙවලම් හා බෙහෙත් විශාල හිඟයක් පවතී.

මේ පිළිබඳ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඉහල නිලධාරින්ට පසුගිය වසර පුරාවට දැනුම්දී ඇතත් මේ දක්වා කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොමැත. මේ සඳහා පිළියමක් ලෙස හෘදරෝග ශල්‍ය වෛද්‍යවරුන්ගේ ඉල්ලීම පරිදි කුරුණෑගල ශික්ෂණ රෝහලේ මහල් 6ක හෘදරෝග ඒකකයක් 2008 දී පිහිටවනු ලැබුවද එම ඒකකයේ ශල්‍යාගාර මේ වනතුරුත් ස්ථාපිත කර නොමැත. කුරුණෑගල ශික්ෂණ රෝහලේ හෘද ඒකකයේ හෘදශල්‍යාගාරය ස්ථාපිත කිරීමට ඉල්ලා හෘදරෝග ශල්‍ය විශේෂඥ වෛද්‍යවරුන් සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත ලිඛිතව අවස්ථා කිහිපයක් ඉල්ලීම් කර ඇතත් අද වනතුරුත් කිසිදු ප්‍රතිචාරයක් ලැබී නොමැත.

ඉහත හේතුන් පදනම් කරගෙන මෑත කාලයේ හෘදරෝග ශල්‍ය විශේෂඥ වෛද්‍යවරු 06 දෙනෙකු රජයේ රෝහල් වලින් ඉවත් වී ඇති අතර ඉන් 03 දෙනෙකු පෞද්ගලික අංශයට සම්බන්ධ වී ඇති අතර අනෙක් 03 දෙනා විදේශගතවී ඇත. මෙය දැඩි අවධානම් තත්වයකි.

එම නිසා මෙහි බැරෑරුම්කම අමාත්‍යාංශයේ අදාල බලධාරින් තේරුම් ගෙන, දැනට ශල්‍යකර්ම සිදුකරන රජයේ රෝහල් කිහිපයේ යටිතල පහසුකම් දියුණු කිරීමට කටයුතු කල යුතු අතර කුරුණෑගල රෝහලේ ස්ථාපනය කිරීමට නියමිතව තිබෙන හෘදරෝග ශල්‍යාගාර ඉතා ඉක්මනින් විවෘත කර අසරණ රෝගී ජනතාවට සහනයක් ලබා දෙන මෙන් බලකර සිටිමු.

ස්තූතියි,

නලින් ආරියරත්න
සහකාර ලේකම්

වෛද්‍ය නවීන් සොයිසා : 0718582444
වෛද්‍ය නලින් ආරියරත්න : 0714800942
වෛද්‍ය ප්‍රසාද් රණවීර : 0773527476